# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් “InsureChamp 2025” අන්තර්-විශ්වවිද්‍යාල රක්ෂණ ප්‍රශ්න විචාරාත්මක තරඟය ආරම්භ කරයි

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් "*අනාගත රක්ෂණ නායකයින් සවිබල ගැන්වීම*" යන තේමාව යටතේ “InsureChamp 2025” අන්තර්-විශ්වවිද්‍යාල රක්ෂණ ප්‍රශ්න විචාරාත්මක තරඟාවලියක් ආරම්භ කිරීම සාඩම්බරයෙන් නිවේදනය කරයි.

මෙම ජාතික මට්ටමේ ප්‍රශ්න විචාරාත්මක තරඟයේ අරමුණ වන්නේ දිවයින පුරා සිටින රාජ්‍ය, අර්ධ-රාජ්‍ය සහ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනවල උපාධි අපේක්ෂකයින් එකට එක් කර ඔවුන්ගේ රක්ෂණය සහ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීමයි. තවද, මූල්‍ය ආරක්ෂාව සහ ජාතික මට්ටමෙන් ඔරොත්තු දීමේ හැකියාව සඳහා අඩිතාලමක් ලෙස රක්ෂණයේ වැදගත්කම පිළිබඳව නව තරුණ පරපුරට අවබෝධයක් ලබාදීම මෙහි අරමුණයි.

මෙම තරගය, 2025 නොවැම්බර් මස 20 වන බ්‍රහස්පතින්දා දින, පස්වරු 1.30 සිට පස්වරු 5.00 දක්වා, කොළඹ සෆායර් උත්සව ශාලාව, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්වීමට නියමිතය.

මෙම තරඟය සඳහා කණ්ඩායමක් (01) බැගින් නම් කරන ලෙස ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනත් මගින් පිහිටුවා ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ පවතින විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කිරීමේ ආයතන සහ අනෙකුත් රජයේ විශ්වවිද්‍යාල සහ ආයතන වෙතින් ඉල්ලා ඇත. අද වන විට, විශ්වවිද්‍යාල/ආයතන 18 ක් සිය සහභාගීත්වය තහවුරු කර ඇති අතර එමගින් දිවයින පුරා විශ්වවිද්‍යාල ප්‍රජාව වෙතින් ලැබී ඇති ඉහළ තරගකාරී සහ දිරිගන්වන සුළු ප්‍රතිචාරය පෙන්නුම් කරයි.

මෙම ප්‍රශ්න විචාරාත්මක තරඟය මගින් සාමාන්‍ය සහ ජීවිත රක්ෂණය, මූල්‍ය සාක්ෂරතාව, වත්මන් සිදුවීම් සහ තාර්කික චින්තනය ඇතුළු පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරනු ඇත. තරඟයේ ප්‍රථමස්ථානය, දෙවන ස්ථානය සහා තෙවන ස්ථානය සඳහා ආකර්ෂණීය මුදල් ත්‍යාග පිරිනැමෙන අතර කණ්ඩායම් හැඟීමෙන් තරඟ කිරීම වෙනුවෙන් විශේෂ සම්මානයක් ද පිරිනමනු ලැබේ. සියළුම සහභාගිවන්නන්ට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙතින් සහභාගීත්වය සඳහා සහතික පත්‍ර පිරිනමනු ලැබේ.

InsureChamp 2025 හරහා, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අපේක්ෂා කරන්නේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය, අවදානම් පිළිබඳව දැනුවත්භාවය සහ තරුණ ප්‍රජාව සහ රක්ෂණ කර්මාන්තය අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම මඟින් කණ්ඩායම් හැඟීම ප්‍රවර්ධනය කිරීමත්‍ය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වන මහල,
නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01

| වෙබ් අඩවිය: www.ircsl.gov.lk | ඊමේල්: info@ircsl.gov.lk |
|---|---|

| | |
|---|---|
| දුරකථනය: 011 2396184 - 9 | ෆැක්ස්: 011 2396190 |


**Date:** 10/11/2025